# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/21 - 2018 අප්‍රේල් මස 04 වැනි බදාදා - 2018.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ අංක 02 පුලියන්කුලම් කොට්ඨාසයට තේරී පත් වූ රාසතුරෙයි සිවරාජා අයත් වන්නා වූ ඉලංගෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥ පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ අංක 02 පුලියන්කුලම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා එලියේසර් ඥාණනායගම් ඥාණගුණාලන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී සජිත් වසන්ත වෙල්ගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් එලියේසර් ඥාණනායගම් ඥාණගුණාලන් ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ අංක 02 පුලියන්කුලම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සජිත් වසන්ත වෙල්ගම,
තේරීම්භාර නිලධාරී,
ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

04 - 680


1A - G 27413 — 27 (2018/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ත්‍රිකුණාමලය නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය නගර සභාවේ අංක 01 අන්බූවලිපුරම් කොට්ඨාසයට තේරී පත් වූ තුරෙයිරාසා ධනරාජ් අයත් වන්නා වූ ඉලංගෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ත්‍රිකුණාමලය නගර සභාවේ අංක 01 අන්බූවලිපුරම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා නාගරාසා රාසනායගම් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

ත්‍රිකුණාමලය නගර සභාවේ තේරීම්භාර නිලධාරී සජිත් වසන්ත වෙල්ගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1) (අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නාගරාසා රාසනායගම් ත්‍රිකුණාමලය නගර සභාවේ අංක 01 අන්බූවලිපුරම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සජිත් වසන්ත වෙල්ගම,
තේරීම්භාර නිලධාරී,
ත්‍රිකුණාමලය නගර සභාව.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

04 - 681

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.